# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

## නිවේදනයයි

### 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිලිබඳ පනත

ඉහත පනත යටතේ මෙම ආයතනයට අදාළ තොරතුරු දැන ගැනීම සඳහා පහත සඳහන් තොරතුරු නිලධාරියා වෙත RTI 01 දරණ අයදුම් පත්‍රය මගින් අයදුම් කල හැකිය. මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්‍යය නොවේ.


<u>තොරතුරු නිලධාරියා</u>
ඩී .එම් .එස් .පී . දිසානායක මිය,
ප්‍රලේඛන හා වෙබ් අඩවි කළමනාකාරිනිය,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
නො. 152/1, රේඩාර් කුලුන ඉදිරිපිට, මිනුවන්ගොඩ පාර, කටුනායක.

විද්‍යුත් තැපැල: mgrdw@caa.lk
දුරකථන අංක: +94 11 2358944/ +94 766 317 390


1) තොරතුරු ලබා ගැනීමට ලිඛිත RTI 01 අයදුම්පත්‍රය හෝ ලිපියක් හෝ වාචික ඉල්ලීමක් තොරතුරු නිලධාරියා වෙත ඉදිරිපත් කර එය ලැබුණු බවට ලිපියක් ලබාගන්න.

2) ඔබේ ඉල්ලීමට අදාළ තොරතුරු සැපයිය හැකිද යන්න පිළිබඳව හැකි ඉක්මනින්, කෙසේ වුවද දින 14 ක් තුළ දන්වනු ලැබේ.

3) ඉල්ලා සිටින ලද තොරතුරු ඔබට දීමට තීරණය කළහොත් කොමිෂන් සභාව නියම කල ගාස්තුවක් ගෙවිය යුතු නම් එය ඔබට දන්වා එවනු ඇත. තොරතුරු ලබා ගැනීමට ගෙවීමක් කල යුතු නම් ඒ අනුව ගාස්තු ගෙවීම මත හෝ ගාස්තු ගෙවිය යුතු නොවේ නම් ගාස්තු රහිතව ඔබට දින 14 ක් තුළ තොරතුරු ලබාදෙනු ඇත.

4) ගාස්තු ගෙවීමෙන් පසු දින 14 ක් තුළ තොරතුරු ලබාදීම අපහසු වේ නම් තොරතුරු නිලධාරියා විසින් එකී කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය හේතු සඳහන්කරමින් දින 21කට නොවැඩි අතිරේක කාලයක් තුළ ඔබ ඉල්ලා සිටි තොරතුරු ඔබට ලබාදෙනු ඇත.

5) තොරතුරු ලබාගැනීම සඳහා වන ඉල්ලීම යම් පුරවැසියෙකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වන අවස්ථාවක ඉල්ලීම සඳහා ප්‍රතිචාර දැක්වීම ඉල්ලීම ලැබී පැය 48ක් තුළ සිදු කරනු ඇත.

6) තොරතුරු ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලීමකට අදාලව;
   I. තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම.
   II. පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරු හේතුවෙන් යම් තොරතුරක් වෙත ප්‍රවේශවීම සඳහා අවස්ථාව ලබාදීම ප්‍රතික්ෂේප කිරීම.
   III. පනත මගින් නිශ්චිතවම දක්වා ඇති කාලසීමාවන්ට අනුකූල නොවීම,

IV. සම්පූර්ණ නොවූ, නොමග යවන හෝ සාවද්‍ය තොරතුරු ප්‍රදානය කිරීම,

V. වැඩිපුර ගාස්තු අයකිරීම,

VI. ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු සැපයීමට තොරතුරු නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කිරීම,

VII. එම තොරතුරු වෙත එම පුරවැසියා ප්‍රවේශවීම වැළැක්වීම සඳහා එම තොරතුරු විකෘතිකර, විනාශ කර හෝ අස්ථානගත කර ඇති බවට තොරතුරු ඉල්ලා සිටිනු ලබන පුරවැසියා හට සාධාරණ හේතු පැවතීම

යන කරුණු මත අතෘප්තියට පත්වන්නේ නම් පහත සඳහන් නම් කල නිලධාරියා වෙත දින 14ක් තුල අභියාචනයක් ඉදිරිපත් කරන්න.

<u>නම් කල නිලධාරියා</u>
ආර්. එම්. වන්නිඅප්පා මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන් ප්‍රවාහන හා ආරක්ෂක නියාමන)
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
නො. 152/1, රේඩාර් කුලුන ඉදිරිපිට, මිනුවන්ගොඩ පාර, කටුනායක.

විද්‍යුත් තැපැල: dater@caa.lk
දුරකථන අංක: +94 11 2358863/ +94 773 130 027

7) මෙම නිවේදනයේ 6 වන වගන්තිය පරිදි අභියාචනයක් ඉදිරිපත් කිරීමේ දී RTI 10 දරන අයදුම්පත පුරවා ඉදිරිපත් කරන්න. RTI 10 දරන අයදුම්පත පිරවීම අනිවාර්ය නොවේ. තොරතුරු ඉල්ලා සිටින්නාට RTI 10 අයදුම්පතේ සඳහන් අභියාචනය විභාග කිරීමට අවශ්‍ය මූලික තොරතුරු සඳහන් කරමින් ලිපියක් මගින් අභියාචනය ඉදිරිපත් කල හැක.

පී. ඒ. ජයකාන්ත
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරි

2023 ඔක්තෝබර් 23